# ලංසු සඳහා ආරාධනයයි!
# දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය.

## විශේෂ හා සුඛෝපභෝගී සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර නිකුත් කිරීම.

මගී ඉල්ලුම හා රටේ සංවර්ධන අවශ්‍යතා අනුව අධිකාරිය විසින් හදුනාගත් මාර්ග සඳහා සුඛෝපභෝගී බස් සේවා වාර්ෂිකව ලංසු මුදල ගෙවීමේ පදනම යටතේ නව මගී ප්‍රවාහන බලපත්‍ර 04 ක් නිකුත් කිරීමට, යෝග්‍යතා පූර්ණ සුදුසුකම්ලත් ලංසුකරුවන්ගෙන්, මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ. විශේෂ හා සුඛෝපභෝගී සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර සඳහා ලංසු පිරිනැමීමේ අයිතිය අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතුය. මෙම බලපත්‍රය වාර්ෂික බලපත්‍ර ලෙස නිකුත් කරනු ලබන බැවින් සෑම වර්ෂයක් අවසානයේදීම බලපත්‍රය ලබා ගැනීමට, ඔබ විසින් බලපත්‍රය ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලබන ලංසු මුදල ගෙවා, වාර්ෂිකව බලපත්‍රය ලබා ගතයුතු වේ. ලංසු සඳහා ආරාධනා කරනු ලබන මාර්ග පහත පලකරනු ලබන අතර, සෑම බස් සේවාවක් සඳහාම පහත ලේඛනයේ සඳහන් අනුමත ආසන ධාරිතාවයෙන් යුතු බස්රථයක් ඉදිරිපත් කල යුතුය. ලංසුකරණය, ජාතික තරඟකාරී ලංසුකරණ කැඳවීම (NCB) යටතේ ලංසු ආරාධනා කැඳවනු ලැබේ.

- වෙන් වෙන් වශයෙන් එක් ලංසුවකට රුපියල් පනස් දහසක් බැගින් (රු. 50,000/-) ආපසු ගෙවනු ලබන ඇප මුදලක් තැන්පත් කල යුතුය.
- ලංසු සඳහා ආරාධනය කරනු ලබන සෑම මාර්ගයක් වෙනුවෙන්ම නියමිත කාලසටහන් හා ගාස්තු සටහන් සකස් කර ඇති අතර ලංසු ලේඛනය තුල අයදුම්පත්‍රය සමග කාලසටහන් හා ගාස්තු සටහන් පිළිබඳ විස්තර ලබා දෙනු ලැබේ.

ලංසු තැබීම මගින් ලබාදෙනු ලබන මාර්ගවල ගමනාන්ත, අනෙකුත් බස් සේවාවන්ට වන බලපෑම හා නීතිමය කරුණු මත දීර්ඝ කිරීමක් හෝ වෙනත් මාර්ග සඳහා සංශෝධනය කිරීමක් ඉල්ලා සිටීමට හිමිකමක් නොමැත. මෙම මාර්ගවල මගී අවශ්‍යතාවය මත බස් සේවා තර කිරීමේදී ශ්‍රී ලංගම සමග (60%-40%) පදනම මත අනාගතයේ බස් සේවා තර කිරීම සිදු කෙරේ. ඒ අනුව මාර්ග පරීක්ෂා කර, බස් සේවාව පවත්වාගෙන යාමේ හැකියාව සලකා බැලීමෙන් පසු, ලංසු වටිනාකම ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙමි. මගී සේවාව පිළිබඳ අවබෝධයකින් තොරව බලපත්‍රය ලබා ගැනීම සඳහා ඉහල මිල ගණන් ඉදිරිපත් කොට, ඒ මත පසුව අභියාචනා කිරීමේ අයිතියක් ඉල්ලුම්කරුට නොපවතී.

ටෙන්ඩර් හිමිකම ලබාගැනීමෙන් පසු දින 60 ක කාලය ඇතුලත බලපත්‍රය ලබාගෙන බස් සේවාවක් ආරම්භ කල යුතු අතර, නියමිත දිනට හෝ ඊට පෙර බස් සේවාව ආරම්භ කිරීමට අපොහොසත් වන්නේ නම් තවදුරටත් අධිකාරියේ බලපත්‍ර සඳහා ලංසු තැබීමට නුසුදුස්සකු සේ සලකා අසාධු ලේඛන ගත කරනු ලැබේ. ලංසු ආරාධනාවට අදාල උපදෙස්, නියමයන් හා කොන්දේසි අයදුම්පත්‍රය සමග ඉදිරිපත් කරන බැවින් ඒ පිළිබඳ අවබෝධයකින් යුතුව ලංසුකරු ලංසු අයදුම්පත්‍රය ඉදිරිපත් කල යුතුය.

# ලංසු තැබීම සඳහා ඉදිරිපත් කරනු ලබන මාර්ගවල විස්තර

| විශේෂ හා සුඛෝපභෝගී සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර (අධිවේගී මාර්ගය හරහා) | | | | |
|---|---|---|---|---|
| විශේෂ හා ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාවය | වාර්ෂික අවම ලංසු වටිනාකම රු. |
| OPR/FI/15/AC/2026/03 | 363/20/EX/AC | මිද්දෙණිය - වලස්මුල්ල - තිහගොඩ - ගාල්ල - කරාපිටිය(කපුදූව - පින්නදූව අධිවේගී මාර්ගය හරහා) | 29 හෝ ඊට වැඩි | 682,080.00 |
| OPR/FI/15/AC/2026/04 | 17/EX/AC | සූරියවැව - පදලංගල - කරාපිටිය - ගාල්ල (අඟුණුකොළපැලැස්ස - පින්නදූව අධිවේගී මාර්ගය හරහා) | 29 හෝ ඊට වැඩි | 386,280.00 |
| OPR/FI/15/AC/2026/05 | 17/1/EX/AC | මීගහජදුර - සූරියවැව - පදලංගල - මාතර(බරවකුඹුක - පාලටුව අධිවේගී මාර්ගය හරහා) | 29 හෝ ඊට වැඩි | 487,200.00 |

| විශේෂ හා සුඛෝපභෝගී සේවා වාර්ෂික මගී ප්‍රවාහන බලපත්‍ර | | | | |
|---|---|---|---|---|
| විශේෂ හා ලංසු යොමු අංකය | මාර්ග අංකය | සේවාව | අනුමත ආසන ධාරිතාවය | වාර්ෂික අවම ලංසු වටිනාකම රු. |
| OPR/FI/15/AC/2026/06 | 369/AC | තවලම - මල්පුදනඇල්ල - අකුරැස්ස - ඉමදූව - ගාල්ල - කරාපිටිය | 29 හෝ ඊට වැඩි | 544,272.00 |

1. අභිලාශී ලංසුකරුවන්ට සිංහල භාෂාවෙන් සකස් කරන ලද අංග සම්පූර්ණ ලංසු ලිපි ලේඛන කට්ටලයක් ඉහත දක්වා ඇති ලංසු ආරාධනාවෙහි සඳහන් ලංසු සඳහා ආපසු ගෙවනු නොලබන රුපියල් තුන් දහසක (රු.3,000/- ක) අයදුම්පත්‍ර ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් අනතුරුව **2026/08/03** වන දින සිට **2026/09/03** දින දක්වා කාර්යාල දිනයන් තුල පෙ.ව. **08.30** සිට ප.ව **03.00** දක්වා ගාල්ල බස් නැවතුම්පොල උඩු මහලේ පිහිටි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයෙන් ද තංගල්ල - බෙලිඅත්ත පාර, සමුපකාර ගොඩනැගිල්ල, අංක **178** හි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලයෙන් ද මාතර, වෙරළපාර, **LGJ** ගොඩනැගිල්ල, අංක **11/1** හි පිහිටි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ මාතර දිස්ත්‍රික් කාර්යාලයෙන් හා ගාල්ල, කොටුව, ලේන්බාන්වීදිය, නො.**67** හි පිහිටි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැකිය. තවද **2026/09/04** දින පෙ.ව. **08.30** සිට **12.00** පැය දක්වා පමණක් ගාල්ල බස් නැවතුම්පොල

උඩු මහලේ පිහිටි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගාල්ල දිස්ත්‍රික් කාර්යාලයෙන් හා ගාල්ල, කොටුව, ලේන්බාන්විදිය, නො.67 හි පිහිටි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙන් අයදුම් පත්‍ර ලබා ගත හැක.

2. පූර්ව ලංසු රැස්වීමක් 2026/08/25 දින පෙ.ව 11.00 ට දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වේ. (ලංසු තැබීමට අපේක්ෂා කරන අයට තවදුරටත් පැහැදිලි කර ගැනීම සඳහා)

3. අභිලාශී යෝග්‍යතා පූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් හට වැඩිදුර තොරතුරු හා ලංසු ලිපි ලේඛන කාර්යාල වේලාව තුල අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදි නොමිලේ පරීක්ෂා කිරීම සිදු කල හැකිය.

4. 2026/09/04 වන දින ප.ව 2.00 ට ලංසු භාර ගැනීම අවසන් කරන අතර ඉන් අනතුරුව ලංසු විවෘත කරනු ලැබේ.

5. නිසි පරිදි සම්පූර්ණ කර, මුද්‍රා තබන ලද ලංසු අයදුම්පත "අනුපිටපතකින්" යුක්තව ලියාපදිංචි තැපැලෙන් ගාල්ල, කොටුව, ලේන්බාන් විදිය, නො.67හි පිහිටි දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ලැබෙන සේ යොමු කිරීම හෝ අධිකාරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම ලංසු ලබා ගන්නා අවසන් වේලාවට හෝ ඊට පෙර සිදු කල යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු අයදුම්පත් භාරගනුනොලැබේ. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ලංසු යොමු අංකය හා මාර්ග අංකය පැහැදිලිව සඳහන් කල යුතුය.

6. ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා අනිවාර්යයෙන්ම සහභාගී විය යුතු බව දැනුම් දෙමි. මෙම නියෝගය කඩ කරනු ලබන අයදුම්කරුවන්ගේ ලංසු අයදුම්පත විවෘත කරනු නොලැබේ. ඕනෑම ලංසුවක් පිලිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

මුලික තොරතුරු දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ ගාල්ල/මාතර/හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාල වලින් හා අංක : 67, ලේන්බාන් විදිය, කොටුව, ගාල්ල ලිපිනයේ ඇති ප්‍රධාන කාර්යාලයෙන් හෝ www.sprpta.lk වෙබ් අඩවියෙන් හා දුරකථන අංක 091- 2234237/091-2227074 මගින් විමසිය හැකිය.

එම්.බී.චන්ද්‍රනිමල්
සභාපති
ද.ප.මා.ම.ප්‍රවාහන අධිකාරිය
ගාල්ල.
**2026/07/31**